


**ශ්‍රී. බු. ව. 2555 ක්වූ බක් මස කලාපය, රා. ව. 2012 ක් වූ අප්‍රේල් මස 06 වන දින**

**වැලිගම ශ්‍රී සුගත ශාන්තිසේවා සංසදයේ නිර්මාතෘ ගරු යාවජීව සභාපති**

**ටී. ඩබ්ලිව්. ඒ. කල්‍යාණ වසන්ත මහතා විසිනි.**

**නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!**

# ප්‍රේමයෙන් වැළඳගන්නා දෙවශය අත්හරිමු.

**(අඞගුතතර නිකායේ පේමදෝස සූත්‍රය ඇසුරිනි.)**

**ධම්කාමී පින්වතුනි,**

**අද ක්‍රි.ව. 2012 වසරේ අප්‍රේල් මස 06 වන දිනට යෙදුනු බක්මස පුර පසළොස්වක පොහොය දිනය යි. අද දහම් පණිවුඩය සඳහා මාතෘකාව වූයේ බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ පේමදෝස සූත්‍රය යි.**

**මහණෙනි, මෙසේ සතර ධර්මයක් උපදිති. කිනම් සතරක් ද(1) ප්‍රේම හේතුවෙන් ප්‍රේමය උපදී. (පෙමා පෙමං ජායතී) 2. ප්‍රේම හේතුවෙන් ද්වේශය උපදී. (පෙමා දොසො ජායති) 3. ද්වේශ හේතුවෙන් ප්‍රේමය උපදී. (දොසා පෙමං ජායති) 4. ද්වේශ හේතුවෙන් ද්වේශය උපදී, (දොසා දොසො ජායතී)**

**මෙහිදී තථාගතයන් වහන්සේ පෙන්වා දෙනුයේ යම්කිසි පුද්ගලයෙකුගේ සිත තුළ කෙළෙස් පහළ වීමේ ආකාර හතරකි. ප්‍රේමය යනු ලෙන්ගතු කමයි. ද්වේශය යනු තරහව කෝපය යි. මෙම ප්‍රේමයත් ද්වේශයත් දෙකම සත්වයා දුකට හෙවත් ලෝකයේ ඇද බැඳ තබන ලක්‍ෂණ දෙකකි. හේතු දෙකකි. පළමුවෙන් තථාගතයන් වහන්සේ**

ඉහතකී ආකාර හතර ඇතිවන විදි සූත්‍රය ආරම්භ කරමින් පෙන්වා දෙනව

''කථංඤ්ච භික්ඛවෙ පේමා පෙමං ජායති?'' (මහණෙනි කෙසේ ප්‍රේමය හේතුවෙන් ප්‍රේමය උපදනේ ද?) මහණෙනි, මේ ලෝකයේ යම්කිසි කෙනෙක් තවත් කෙනෙකු වෙනුවෙන් ඉෂ්ට වූයේ කාන්ත වූයේ මනාප වූයේ (ප්‍රියතාවයක් සිත් අළවන ස්වභාවයක් මනවඩවන ස්වභාවයක්) ඇතිකර ගත්තා ද, වෙනත් පුද්ගලයෝ ඉහත කී පුද්ගලයා පිළිබඳව ඉෂ්ට කාන්ත මනාප වචනයෙන් කථා කරති. ඔහු මෙසේ සිතයි. මට යමෙක් ප්‍රිය ද අන්‍යයාද ඔහු ගැන යහපත් ලෙස හොඳ කියයි. සිතා ඔවුන් කෙරෙහි පෙම් උපදව යි. ''එවං ඛො භික්ඛවෙ පෙමා පෙමං ජායති... '' (මෙලෙස ප්‍රේමයෙන් ප්‍රේමය උපදී.)

''කථංඤ්ච භික්ඛවෙ පෙමා දෙසො ජායති (මහණෙනි, කෙසේ ප්‍රේම හේතුවෙන් ද්වේශය උපදින්නේ ද? මේ ලෝකෙ යම්කිසි පුද්ගලයෙක් තවත් කෙනෙකුට ඉෂ්ට ද කාන්ත ද මනාපද වේ. අන්‍ය වූ ලෝකයා ඔහු ගැන අනිෂ්ට අකාන්ත අමනාප ලෙස ඔහු පිළිබඳව කථා කරයි ප්‍රියභාවයකින් කථා නොකරයි. පළමු තැනැත්තාට මෙසේ සිතෙයි. ''මම ප්‍රේම කරන (ඉෂ්ට කාන්ත මනාප ලෙස දකින) පුද්ගලයාට මොවුන් අනිෂ්ට අකාන්ත අමනාප වචනයෙන් කථා කරයි.'' සිතා ඔවුන් කෙරේ ද්වේශය උපදව යි. ''එවං ඛො භික්ඛවෙ පෙමා දොසො ජායති'' ( මහණෙනි, ප්‍රේම හේතුවෙන් ද්වේශය උපදී)

කථංඤ්ච භික්ඛවෙ දොසා පෙමං ජායතී? (මහණෙනි, කෙසේ ද්වේශයෙන් ප්‍රේමය උපදනේද?) මෙලොව යම්කිසි පුද්ගලයෙක් තවත් කෙනෙකුට අනිෂ්ට අකාන්ත අමනාප වෙයි (ද්වේශ කරයි) වෙනත් අය ද ඔහුට අනිෂ්ට අකාන්ත අමනාප ලෙස සළකයි. ඉහත කී පළමු පුද්ගලයාට සතුටුයි ඔවුන් කෙරේ ප්‍රේමය උපදවයි, ලෙන්ගතු වේ. (එවං ඛො භික්ඛවෙ දොසා පෙමං ජායති) මහණෙනි, මේ ලෙසට ද්වේශ හේතුවෙන් ප්‍රේමය හටගනී,

කථංඤ්ච භික්ඛවෙ දොසා දොසො ජායති? (මහණෙනි, කොහොමද? ද්වේශ හේතුවෙන් ද්වේශය උපදිනුයේ යත්) මෙලොව යමෙක් යමෙකුට අනිෂ්ටද, අකාන්ත ද, අමනාප ද, වෙනත් අය ඔහුට ඉෂ්ට ද, කාන්ත ද මනාප ද, ඔහුට මෙසේ සිතෙයි. මට අනිෂ්ට අකාන්ත අමනාප වූ (මම ද්වේශ කරන ) පුද්ගලයාට මොවුන් ප්‍රේම කරයි. යනුවෙන් සිතා ඔවුන්ට ද්වේශ කරයි. (එවං ඛො භික්ඛවෙ දොසා දොසො ජායති) මෙලෙසින් ද්වේශ හේතුවෙන් ද්වේශය උපදිති. ඉමානි

බො භික්‍ඛවෙ චත්තාරි ජායන්ති (මහණෙනි, මෙලෙසින් මේ සතර දෙනා ඇතිවේ, )

අනතුරුව බුදුපියාණන් වහන්සේ භික්‍ෂුන් වහන්සේ අමතා ඉහත කී සිතෙහි හටගන්නා තත්වය ධර්මානුකූලව නැතිකරන ආකාරය පැහැදිලි කරනව. මහණෙනි, පංචකාම ගුණයෙහි ඇළෙන සෑම සත්වයෙකුටම මෙම ස්වභාවය සාධාරණය අනන්ත කාලයක් ඔහු සසරෙ ඇවිද්දේද , ඇවිදින්නේ ද, මෙම හේතු ප්‍රත්‍යයෙන් ඇතිවන පසුබිම නිසා ය. යම් කළෙක පුද්ගලයා කාමයෙහි ආදීනව දැන එයින් වෙන්ව නීවරණයන්ගෙන් වෙන් වී ප්‍රථම ධ්‍යානයට පත්වේ ද ඔහුට ප්‍රේමහේතුවෙන් ප්‍රේමයක් උපදී ද, ප්‍රේමහේතුවෙන් ද්වේශයක් උපදී ද, යම් ද්වේශ හේතුවෙන් ප්‍රේමයක් උපදී ද, ද්වේශ හේතුවෙන් යම් ද්වේශයක් උපදී ද, ඔහුට එය නොවේ.

තව දුරටත් පැහැදිලි කරන සුගතයන් වහන්සේ මහණෙනි. සිතතුළ හටගන්නා ඉහත කී දුර්වලතාව නුවණින් සළකා බලමින් සංසිඳීම කළේ ද? දෙවන, තුන්වන, සතරවන ධ්‍යානයන් දක්වා දියුණු කරයි ද ඒ අනුව වාසය කෙරේ ද ඔහුට ප්‍රේම හේතුවෙන් ප්‍රේම තත්වයක් ආදී වශයෙන් සතර ආකාරයටම නොඋපදින බව වදාළ හ..

මහණෙනි, කෙළෙසුන්ගෙන් වෙන්ව, අනාශ්‍රව භාවයට සිතේ විමුක්තිය ප්‍රඥා විමුක්තිය මෙලොවදීම තමන් විසින් විශේෂයෙන් දැන ප්‍රත්‍යක්‍ෂ කොට වෙසේ ද ඔහුට ප්‍රේමහේතුවෙන් යම් ප්‍රේමයක් උපදී ද, ඔහුට එය ප්‍රහීණ වෙයි. කිසි කලක සිදුනොවේ. "උච්ඡින්නමූලං තාලා වත්ථුකතං" මුදුන කැඩුණු තල්ගසක් ලෙසට මතු නොඋපදිනා ලෙසට අවස්තුක වේ. අභාවයට පත්කලා වේ.

තවදුරටත් උන්වහන්සේ ඉහත කී ප්‍රේමයත් ද්වේශයත් හටගන්නා මූල කාරණ පැහැදිලි කරනවා. එනම්,

* පඤ්ච උපාදානස්ඛන්ධය (රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ) ආත්මලෙස හැමදා එකලෙසින් තමන් ට වසඟයේ පැවැත්විය හැකි ය. දුකක් නොවේ යන වැරදි හැඟීම.
(උසෙසනෙති)

* කෙනෙකුට කෙනෙක් ආක්‍රෝශ කිරීම කෝප ගැනීම දබර කිරීම ආදිය එකට එක කරමින් කලහ විග්‍රහ විවාද කිරීම (පටි සෙසනෙති)

* මමය මගේය යන ළාමක අධාර්මික (ධර්මානුගත නොවූ) අදහස සිතට ළගාකරගෙන මම මෙසේ වෙමි. මෙසේ වේවායි සිතීම් පැතීම් ඇතිව ළාමක තීරණයන්ට පැමිණීම ගින්නෙන් නිකුත්වෙන දුමක් ලෙසින් පැවැත්වීම (ධූපායති)

* තෘෂ්ණා සංසිදීමක් නැතිව තෘෂ්ණාව අනුවම හැසිරෙමින් තමා පිළිබඳ මෙසේ වෙමි. මෙසේ වේවා යි සීතිම පැතීම ගිනි ඇවිලීම ලෙසට සිත පැවැත්වීම, ප්‍රාර්ථනා කිරීම තම

සිතැගියාවට අනුව ධර්මයට එකඟ නොවූ සිත පැවැත්වීම (පජ්ජලති)

* මමය මගේය යන ආත්මවාදී හැගීමෙන් යුතුව ළාමකව සිත පැවැත්වීම (අස්මිමානය පැවැත්වීම) ප්‍රහීනනොකිරීම උත්සාහ නොකිරීම මතු මතුත් එම ක්ලේශයන් උපදීමට ස්වභාවයක් ඇතිකිරීම (අපජ්ඣායති)

වරක් විශාකා මහා උපාසිකාවට එතුමියගේ මිණිබිරියගේ මරණය සිදුවීමෙන් වූ ශෝක වීම හේතුකොට ''පෙමතො ජායතී සොකො....'' යනාදී ගාථාවෙන් ප්‍රේමය නිසා ශෝකය බිය උපදී. ප්‍රේමයෙන් මිදුන තැනැත්තාට (රහතන් වහන්සේට) ශෝකයක් නැත. බියක් ද නැත. යනුවෙන් වදාරා මහා උපාසිකාවගෙන් මෙසේ ද විමසීය .

''විශාඛාවෙනි ! ශෝක වන්නේ ඇයි?'', ''ස්වාමීනි මිනිබිරියගේ ගුණ සිහිවන විට දුක බලවත්වේ.'', ''මහෝපාසිකාවෙනි ! සැවැත්නුවර මහජනයා කොපමණ වේද?'', ''ස්වාමීනි හත් කෝටියක් පමණ වේ.'' , ''ඒ හත්කෝටියම මිණිබිරියන් වන්නේ නම් ඔබ කැමති ද?'' , ''එසේ ය ස්වාමීනි !'', ''මේ සැවැත් නුවර දිනපතා මිය යන මනුෂ්‍යයෝ කොපමණ වේද?'' ''ස්වාමීනි !, බොහෝ වෙති.'' ''ආයුෂ්මාවෙනි ! මේ නුවර වාසී මනුෂ්‍යයෝ ඔබ මිනිබිරිය හා සමාන වේනම් දිනපතා මැරෙන අය බොහෝ වෙත්නම්, ඒ මරණ වලට ශෝක කිරීමට වඩා ඔබට වෙනදෙයක් කළ හැකි නොවේ.'' යි වදාළ සේක මෙයින් ද හැගීයන්නේ යම් පමණකට ප්‍රේමයත් සෙනෙසත් ඇතිකර ගන්නේ නම් ඒ තරමට දුක සහ බිය ඇතිවන බවයි. අකුසල් මුල් ඉපදීම යි.

ප්‍රේමය යන වචනය වත්මන් ලෝකයේ බොහෝ විට භාවිතා කරන්නේ ගැහැනියක සහ පිරිමියෙකු අතර ඇතිවන සෙනෙහසට යි. එයට ආලය, ආදරය, ප්‍රේමය ස්නේහය යන වචන ව්‍යවහාර කරති.

සමහරු මේ සඳහා මෛත්‍රිය කරුණාව යන වචනද , ප්‍රේමය පාරමිතාවක් ලෙසට ද සිතන්නෝ සිටිති. එය වැරදි භාවිතය කි. ප්‍රේමය නම් විෂයකි. එහි රස විඳීමට තෘෂ්ණාව ලෝභකම රාගය සල්ලාලකම, ප්‍රීතිවීම, යන වචන භාවිතා කරති. එමෙන්ම ඒවායේ අධික තෘෂ්ණාවට කෑතකම, කුණුකම යනවචන ද භාවිතා කරති. මෙය අකුසල මූලය කි.

ඇතැම් පුද්ගලයන් සහ ඇතැම් වස්තූන් ඇතැම් ගුණ සහ ක්‍රියාවන් කෙරෙහි රුචි නොවන ප්‍රිය නොවන ස්වභාවයට ද්වේශය යනුවෙන් ව්‍යවහාර වේ. එය ද අකුසල මූලයකි. එය ද නොයෙක් ආකාරයන්ගෙන් පවතී, ක්‍රෝධය, වෛරය, එදිරිය, නොසතුට පිළිකුල භය කනගාටුව, යනුවෙන් ද්වේශයට භාවිතා කරන වචනයෝ ය. මෙම ද්වේශය තමන්ට වඩා බලයෙන් සමවූ හෝ දුබල වූ කෙනෙකු කෙරෙහි සම්බන්ධව ඇතිවන විට විරුද්ධ වූ ආකාරයෙන් එනම්, ක්‍රෝධය නමින් උපදී.

තමන්ට වඩා බලයෙන් වැඩි තමාට යමක් කර කියා ගත නොහැකි තත්වයේ කෙනෙකු සම්බන්ධව ඇතිවන විට ඒ පුද්ගලයාගෙන් ඈත්වන පසු බසින ආකාරයෙන් ද්වේශය උපදී. එයට බිය යයි කියනු ලැබේ. දිගු කළක් නැවත නැවත ද්වේශය උපදී නම්, වෛරය වේ. යම්කිසිවෙකු හෝ වස්තුවක් කෙරෙහි අප්‍රසන්න අශෝභන තත්වයක් නිසා ඇතිවන ද්වේශය පිළිකුල යි. ඇති තත්වය වරදවා ගන්නා වූ ස්වභාවයෙන් ඇතිවන්නේ මෝහය යි.

සූත්‍රයට අනුව ප්‍රේමයත් ද්වේශයත් නිසා දුක් හටගන්නා බව දැක්වේ. යථාභූත ඥාණයෙන් ලෝකය දකින්නා හට කරාලය කැඩුණු තල්ගසක් සේ නැවත භවයේ නො ඉපදීම දක්වා අවස්තුක භාවයට පත්වන බව කිය යි. මේ සඳහා යෝනිසෝ මනසිකාරය අවශ්‍ය වේ. එනම්, අපායෙන් වෙන්ව උපායෙන් මෙනෙහි කිරීම යි. නොමගට නොව මගින් සිත මෙහෙයවීම යි. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් ඇති හැටියට සිත පවත්වන්නේ ද? නැවත නැවත පැවැත්වීම වේද? අරමුණට අනුව සිත යොදවා ද? එළවීමක් වේද? මෙනෙහි කිරීමක් වේද? එය යෝනිසෝ මනසිකාරය යි.

වත්මන් ලෝකයේ ජීවත්වෙන අපිට ප්‍රේමය ද්වේශය කොපමණකින් බලපානවාද යන්න විමසා බලමු. ලෝකය අද එකිනෙකාට සම්බන්ධ වූ ගැටුම් වලින් පීඩිත වී ඇත. එවන් ලෝකයක ජීවත්වෙන බෞද්ධයින්වූ අප නුවණින් දැක දුක් අවම කරගනිමු. දේශපාලනය නිසා ද්වේශය පාලනය කරගැනීමට බැරිතත්වයක් අද උදාවී ඇත. ඒ බව මාධ්‍ය පුවත් තුළින් මොනවට පැහැදිලි වේ. එයම උදාහරණ කර ගනිමු.

බුදුහිමියන් දැක්වූ ප්‍රේමය සහ ද්වේශය යන වචන දෙක අද ව්‍යවහාරයෙන් අමනාපය සහ අමනාපය බවට පත්වී ඇත.

ප්‍රේමය හේතුකොට ප්‍රේමය උපදී යමෙක් යම්කිසි දේශපාලන පක්‍ෂයකට ඇලුම්කරයි ඉෂ්ඨ කාන්ත මනාප වෙයි. තවත් පිරිසක් එම පක්‍ෂය කෙරෙහි ඉෂ්ඨ කාන්ත වශයෙන් කථාකරති. මුලින් කී පුද්ගලයාට මෙස් සිතෙයි. මගේ පක්‍ෂය කෙරෙහි අනෙක් පිරිස ද ප්‍රේමනීය ලෙස කථාකරයි. හේ ඔවුන් කෙරෙහි ද පෙම් උපදව යි. (මනාපයෙන් මනාපය)

ප්‍රේමය හේතුකොට ද්වේශය උපදී. යමෙක් යම්කිසි පක්‍ෂයකට මනාප වේ. තවත් පිරිසක් අමනාප වේ. මුලින් කී පුද්ගලයාට මෙසේ සිතෙයි. මගේ පක්‍ෂයට මොවුන් අමනාප යි. ඔවුන් කෙරෙහි ද්වේශය උපදී. ඊට හේතුවූයේ තමන් ප්‍රේමකරන පක්‍ෂය යි. උපන්නේ ද්වේශය යි. (මනාපයෙන් අමනාපය)

ද්වේශ හේතු කොට ප්‍රේමය උපදී. යමෙක් යම්කිසි පක්‍ෂයකට අමනාප වේ. තවත් පිරිසක් එම පක්‍ෂය කෙරෙහි අමනාප බසින් දොඩයි. ඔහුට මෙසේ සිතේ'' මම අමනාප පක්‍ෂයට ඔවුන් ද අමනාප යි. එබැවින් ප්‍රමෝදයට පත් වේ. මම සතුටුයි ඔවුන්ට ප්‍රේම කරමි.(අමනාපයෙන් මනාපය)

ද්වේශය හේතුකොට ද්වේශය උපදී. යමෙක් යම්කිසි පක්‍ෂයකට අමනාප යි. තවත් පිරිසක් එම පක්‍ෂයට මනාප යි. ඔහුට මෙසේ සිතෙයි. මම අප්‍රිය කරන පක්‍ෂය ඔවුන්ට මනාප යි. මම ඔවුන්ට ද්වේශ කරමි. යනුවෙන් සිත යි. ද්වේශය නිසා ද්වේශය උපදී. (අමනාපයෙන් අමනාපය)

මෙසේ යම්කිසි පුද්ගලයෙක් වස්තු ආදිය කෙරෙහි හෝ ඉෂ්ට කාන්ත මනාප ලෙස දැක එය හෝ ඔහු කෙරෙහි ප්‍රේමය උපදී ද, ද්වේශය උපදී ද, ඒ හැම දීර්ඝ කාලයක් අහිත පිණිස පවතී. එසේම ද්වේශ සහගත සිතින් යමෙක් දිවිපවත්වා ඔහු මරණින් පසු නරකයෙහි ද යක්‍ෂ රාක්‍ෂ සහ නපුරු වන සතුන් වශයෙන් ද උපදිති. තෘෂ්ණාවෙන් (ප්‍රේමයෙන්) යුතුව වාසය කළේ ද, ඔවුන් මරණින් මතු තිරිසන් බවට සහ ප්‍රේත බවට පමුණුවනු ලැබේ. මෙයට හොඳ නිදසුනක්. පසුගිය දාක රූපවාහිනි ප්‍රචාති විකාශනයකින් දැක ගන්න ලැබින. පෙම්වතා සහ පෙම්වතියක පොලිසිය විසින් අල්ලාගෙන ඔවුන් දෙදෙනා ප්‍රසිද්ධියේ රැගෙන යෑමෙන් ඇති වූ ලජ්ජාව නිසා එම තරුණිය සියදිවිහානිකර ගත් බව ය. මරණයට පෙර ලියමනක මෙසේ ද ලියා තැබුවේ ලු. '' මට සිදුවූ ලජ්ජාවට මතු යක්‍ෂණියක් වී පැමිණ පළිගන්නා බව ය.'' ප්‍රේමය

හේතුවෙන් ද්වේශය මතුවී එම ද්වේශයේ විපාක සසරට ද ගෙනගොස් දුක්විඳීම ය. තරුණ තරුණියන් පෙම් කිරීම ලෝක ස්වභාවයකි . පොලිසිය රාජකාරී කිරීම ද වරදක් නොවේ. එනමුත් පෙම්වතුන් සිතන පරිදි ''ප්‍රේමය ආලෝකය කි'' එහි තුළ අඳුර ද ඇති බව ඔවුන් නොදනිති.

තරුණ තරුණියන් අතර ඇතිවන ප්‍රේමය ද්වේශයක් බවට පත්වී ජීවිත අකාලයේ නැතිවන්නේ ද? නැතිකරගන්නේ ද? බුදු මුවින් වදාළ මෙම දුර්වල තාවය නොසලකා හැරීමෙනි.

දිනක් සුරූපී පෙම්වතුන් 30 දෙනෙක් සුරූපී පෙම්වතියන් 29 ක් සමග උයන්කෙළියට ගිය හ. ඉන් එකෙකු ණයට ගත් අභිසරු ලියකගෙන් අඩුව පිරිමැසී ය. ප්‍රේමයෙන් උද්දාමවී දිය කෙළිද්දී අභිසරු ලිය ඔවුන්ගේ වටිනා ආභරණ රැගෙන පැන ගියෝය . ඔවුන් උයන්බිම දෙවනත්කර ලිය සොය යි. සුන්දර ශ්‍රමණයෙකු රුක් සෙවනක දැහැන් වඩමින් සිටී. කුමාරවරු ඒ ශ්‍රමණයන්ගෙන් අබිසරු ලිය ගැන විමසූ හ. ඒ ශ්‍රමණයන් දෙනෙත් විවර කොට ''අබිසරු ලිය සෙවීමට වඩා තමන් ගැන සෙවීම නරකද?'' යනුවෙන් විමසී ය. තරුණයෝ මුහුණ බලා ගත්වන නිහඬ විය . ''තමා ගැන සොයන්නේ කෙසේ දැ යි'' ශ්‍රමණයන්ගෙන් විමසී ය.

තමා විසින් තමාගෙන් නිදහස්වීමට මගකියා දුන් හ. යෞවනයේ චමත්කාරය යනු ''හැඟීම් වලට ඉඩදීම නොව ඉඩ දිය යුත්තේ බුද්ධියට ය දරුවනේ !'' යනුවෙන් තමන්ට මෙතෙක් කථා බස් කළේ බුද්ධියේ කිරුළ හිමි බුදුහිමියන් බව පසක් කළහ.

හැඟීම් වලට වහල් වූ ජීවිතය තුළින් යෞවනය විනාශ වන්නේ ඉස්ම උරා ඉවත ලන උක්දණ්ඩක විලාසයෙනි. මෙවැනි පසුබිම් ඇතිවන්නේ තෙරුවන් සරණ අහිමි කරගත් ලද බොළඳ මනසක් හිමි නිවට යෞවනයන්ට ය. මේ සූත්‍ර දේශණයට අනුව ජීවිත සැනසීමට තෙරුවන් සරණ අවශ්‍ය වේ. සියලු හැලහැප්පීම් වලට අකම්පිතව මුහුණ දීමට තරුණ වැඩිහිටි බාල හැමට තෙරුවන් සරණ එකම පිහිට කර ගනිමු. සැදැහැ දියුණු කරමු. ධර්මය විශ්වාස කරමු. බක්මස පුර හඳ නැගෙන මේ පෝදින අවිද්‍යාවෙන් අඳුරු වූ ලෝකයට දැහැමි ඔබේ ජීවිතය පුන් සඳක් වේවා.. !